116

දුර්ලභ

# බෞද්ධ හා බටහිර මනෝ චිකිත්සක ක්‍රම පිළිබඳ අධ්‍යයනයක්

පරගොඩ විමලවංස හිමි

116

1989

කැළණිය විශ්ව විද්‍යාලයේ
පාලි හා බෞද්ධ අධ්‍යයන අංශයේ
ශාස්ත්‍රපති උපාධිය සඳහා ඉදිරිපත් කරන ලද
අධ්‍යයන නිබන්ධයකි

## පෙරවදන

බුදුසමය ලෝකයේ ප්‍රධාන ආගම් කිහිපයෙන් එකකි. එය, අදහන ජන සංඛ්‍යාව අතින් ප්‍රමුඛස්ථානයක් නොගනිතත්, එයින් ඉදිරිපත් කොට ඇති සමාජ,සංස්කෘතික හා විමුක්ති දර්ශනය අනුව බෞද්ධ දර්ශනය , ලෝකයේ සෙසු ආගම් හා දර්ශනයන් අභිබවා සිටියි. එය එසේම බවට උගතුන් අතර පවා විවාදයක් නැත. බෞද්ධ දර්ශනය ලෝකයේ සෙසු දර්ශනයන් හා සාපේක්ෂකව සසඳා බලන විට,ජීවගුණය අතින් වඩාත් පෝෂණයක් ලබා ඇති දර්ශනය බෞද්ධ දර්ශනය බව සැලකිය හැකිය. එය පාරලෞකික සුභසිද්ධිය මුල්කොට පවත්නා දර්ශනයක් ලෙස ඇතැමුන් වටහා ගෙන කටයුතු කරන බව පෙනෙතත්,ඇත්ත ඇති සැටියෙන් කියතොත් , බෞද්ධ දර්ශනය පාර-ලෞකික සුභසිද්ධියට වඩා ඓහලෞකික සුභසිද්ධිය සලසන දර්ශනයක් බව කිය යුතුය. බෞද්ධ දර්ශනය විමුක්ති දර්ශනයක් මෙන්ම, සමාජ දර්ශනයක්ද වේ. ඕනෑම කාලයක , ඕනෑම දේශයක , ඕනෑම සමාජයක, සාන්දෘෂ්ටික වශයෙන් ඕනෑම පුද්ගලයෙකුට අත්දැකිය හැකි 'මනුෂ්‍යත්වය පිළිබඳ ජීවගුණය' ඉතා ඉහල මට්ටමකින් එහි අන්තර්ගතව පවත්නා නිසා එය එසේ වේ.

බෞද්ධ දර්ශනය තුළ විද්‍යාමාන මෙම ජීවගුණය,තම තමාගේ ජීවිත තුළටඋරා ගැනීමට ජන සමාජය දක්වන උදාසීනතා වය,අවාසනාවකි. එසේ නොමැති නම් නිර්වාණ දර්ශනය සෘජු ලෙස අරමුණු කොට ගත් දාර්ශනික සංකල්ප වලින් පරිබාහිර වූ ව්‍යවහාරික සමාජයේ අර්ථ සිද්ධිය පිණිස මැනවින් උපයෝගී කොට ගතහැකි, බොහෝ දේ බෞද්ධ දර්ශනය තුළ ගැබ්වී තිබේ. ඒවා දැන හඳුනා ඒවායේ ජීවගුණය තම තමන්ගේ හදවත් තුළට උරා ගැනීමට ජනතාව යොමු වන්නේ නම්,කාලීන සමාජය තුළ, දිනෙන් දිනම උග්‍ර වෙමින් පවත්නා,දැවෙන ප්‍රශ්න වලට ප්‍රත්‍යක්ෂ විසඳුම් එහි තිබේ. සත්‍ය වශයෙන්මබෞද්ධ දර්ශනයේ මුඛ්‍ය අභිලාශය වන්නේ, පරිපූර්ණ මානසික සුවය සංඛ්‍යාත නිර්වාණාවබෝධය ලැබීම හෝ ලබාදීම වුවත්, බෞද්ධ දර්ශනය තුළ බෙහෙවින් ගැබ්ව ඇත්තේ සමාජ ප්‍රශ්න හා ඒවාට විසඳුම් වේ. එම විසඳුම් මානසික වූත්, මෙන්ම කායික වූත් විසඳුම් වේ. එම විසඳුම් මැනවින් නිරීක්ෂණය කරන්නෙකුට සමස්ථ බෞද්ධ දර්ශන-යමත්, ඒ වටා ගොඩනැඟී ඇති බුදු සමයත්, මුළුමනින්ම පාහේ මනෝ චිකිත්සක ක්‍රමයක් බව ඉතා පැහැදිලිව දැකිය හැකිය.

මෙම ශාස්ත්‍රීය සංග්‍රහයෙන් කෙරෙන්නේ , බෞද්ධ දර්ශන විෂය

ශෝත්‍රය ඔස්සේ, එම බෞද්ධ වෛද්‍ය චිකිත්සක ක්‍රමය, බටහිර වෛද්‍ය චිකිත්සක ක්‍රමයද සැලකිල්ලට ගනිමින් සාකච්ඡාවට භාජනය කිරීමයි. මෙම සාකච්ඡාවේදී බෞද්ධ වෛද්‍ය චිකිත්සක කරුණු වලට මුල්තැනක් දී ඇති නමුදු, බටහිර වෛද්‍ය චිකිත්සාව පිළිබඳවද, පාඨකයාට සෑහෙන දැනුමක් ලැබෙන පරිදි සාකච්ඡා කොට ඇත. එසේ සාකච්ඡාකිරීමට හේතුව වූයේ, බටහිර වෛද්‍ය චිකිත්සකයනට වුවද බෞද්ධ වෛද්‍ය චිකිත්සාවෙන් ගතහැකි බොහෝ පාඩම් තිබෙන නිසාත්, බෞද්ධ වෛද්‍ය චිකිත්සකයනට වුවද බටහිර වෛද්‍ය චිකිත්සාවෙන් ලද හැකි හා ලද යුතුබොහෝ පාඩම් තිබෙන නිසාත්, මෙම වෛද්‍ය චිකිත්සක ක්‍රම දෙකම,යම් යම් වෙනස් කම් ඇතිව වුවද සෑහෙන දුරකට එකම මඟක ගමන් කරන නිසාත්ය.

මෙම සාකච්ඡාවේදී, බටහිර වෛද්‍ය චිකිත්සකයන්ගේ අදහස් උදහස් වලට වැඩි තැනක් දෙමින් වෛද්‍ය චිකිත්සාව යනු කුමක්දැයි විග්‍රහ කිරීමට වැඩි උනන්දුවක් දැක්වූ අතර ඒ අනුව වෛද්‍ය චිකිත්සාවට අන්තර්ගත සෑම කරුණක්ම පාඨ දළ වශයෙන් හෝ මෙහිදී සාකච්ඡා කිරීමට අමතක නො කළෙමි. එසේම වෛද්‍ය චිකිත්සක සේවය පිළිබඳවද සැලකිය යුතු මට්ටමක විස්තරයක් මෙහි අන්තර්ගත කොට ඇත. කෙසේ වෙතත්, බෞද්ධ වෛද්‍ය චිකිත්සක කරුණු සාකච්ඡා කිරීමේදී බුදු දහමෙහි ගුගැන්වෙන දාර්ශනික කරුණු වලට වඩා, එදිනෙදා ලෝකයේ, සාමාන්‍ය ජනතා වට පොදුවේ භාවිතා කොට මානසික සහනය ලද හැකි, ' බෞද්ධ වෛද්‍ය චිකිත්සාවේ ප්‍රායෝගික අංශය' පිළිබඳ වැඩි අවධානයකින් කරුණු දැක්වීමි. කෙසේ වෙතත්, චතුරාර්ය සත්‍යය, පටිච්ච සමුප්පාදය වැනි විමුක්ති සුවය පිළිබඳ බෞද්ධ දාර්ශනික කරුණුද නාමමාත්‍ර වශයෙන් හෝ සාකච්ඡා කිරීමට මෙහිදී අමතක නො කළෙමි. ඒ හැරෙන්නට බටහිර වෛද්‍ය චිකිත්සක කරුණු සාකච්ඡා කිරීමේදී යෝග්‍ය යයි හැඟෙන සෑම අවස්ථාවකදීම පාඨකයාගේ සුබාවබෝධය පිණිස ඉංග්‍රීසි යෙදුම් හැකි තරම් දුරට යෙදීමට වැඩි අවධානයක් යොමු කළෙමි. එසේද හැරුණු විට බෞද්ධ වෛද්‍ය චිකිත්සක සේවය පිළිබඳව කරුණු සාකච්ඡා කිරීමේදී, වත්මන් ලාංකික බෞද්ධ සමාජ රටාව උපයෝගී කර ගනිමින්, ප්‍රායෝගික වශයෙන් කරුණු ස්වල්පයක් නිදසුනේ ඉදිරිපත් කිරීමටද අමතක නොකළෙමි.

මේ අයුරින් මෙම ශාස්ත්‍රීය නිබන්ධය සම්පාදනය කිරීමේදී මාගේ ප්‍රධාන උපදේශකවරයා වශයෙන් කටයුතු කරමින්, මෙම කාර්යය හැකි තරම් දුරට සාර්ථක අයුරින් නිම කිරීම සඳහා දැඩි ඇපකැප වීමකින් යුතුව, කළමට හැකි සෑම සහයෝගයක්ම නොඅඩුව ලබා දුන් කැලණිය විශ්ව විද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යයන අංශාධිපති ආචාර්ය

**නිලන් කාරියවසම් මහතාණන්** දැක්වූ අපරිමිත සහයෝගය පිළිබඳව මාගේ හෘදයංගම ගෞරව පූර්වක ස්තූතිය එතුමාණන්ට ප්‍රථමයෙන්ම පිරිනමමි.

එසේම, මෙම ග්‍රන්ථකරණය සැලසුම් කිරීමේදී අවශ්‍ය මූලික උපදෙස් ලබාදී මා මෙම කාර්යයෙහි ලා යොමු කළ ශ්‍රී ජයවර්ධන පුර විශ්ව විද්‍යාලයේ **මහාචාර්ය චන්ද්‍රා වික්‍රමගමගේ මහතාණන්ටත්,** මෙහි කටු සැලැස්ම සම්පාදනය කරදී, මෙම කාර්යයෙහි සාර්ථක අයුරින් නියැලීමට අවශ්‍ය උපදෙස් ලබා දුන්, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ මනෝ විද්‍යාව හා දර්ශනය පිළිබඳ **මහාචාර්ය අභය බණ්ඩාරනායක මහතාණන්ටත්,** බටහිර මනෝ චිකිත්සාව පිළිබඳව ඇති වූ කොයෙතුත් ගැටළු වලදී, එම ගැටළු නිරාකරණය කර ගැනීම සඳහා උපරිම අයුරින් සහයෝගය දැක්වූ කොළඹ වෛද්‍ය පීඨයේ, මනෝ චිකිත්සක අංශ ප්‍රධාන **මනෝ වෛද්‍ය විශේෂඥ නාලක මෙන්ඩිස් මහතාණන් ඇතුළු කාර්ය මණ්ඩලයටත්,** පේරාදෙණිය මහ ආරෝග්‍යශාලාවේ මනෝ චිකිත්සක අංශයේ, **මනෝ වෛද්‍ය පී. යූ. රත්නායක මහත්මිය** ඇතුළු කාර්ය මණ්ඩලයටත්, මෙම කාර්යය සඳහා අතිශයින් වැදගත් වූ පොත් පත් හා ලිපිලේඛන අනගිහයකින් ගෞරව සම්පාදනය කර දුන්, ලිහිණියාගල රාජමහා විහාරාධිකාරී **ශාස්ත්‍රවේදී පල්ලේවෙල සෝරත නාහිමි පාණන් වහන්සේටත්,** මහනුවර බ්‍රිතාන්‍ය මණ්ඩල ( British Council ) පුස්තකාලයාධිපති තුමා ඇතුළු කාර්ය මණ්ඩලයටත්, මෙහි සංශෝධන කටයුතු ඉතාමත් සුපරීක්ෂාකාරී ලෙස මැනවින් ඉටු කර දුන්, නු/ දිඹුල්කුඹුර විද්‍යාලයේ ආචාර්ය **රාජකීය පණ්ඩිත ශාස්ත්‍රවේදී පරණගම විමලධම්ම හිමිපාණන් වහන්සේටත්,** මෙම නිබන්ධය යතුරුලියනය කරගෙන යන අතරතුර නොසිතූ ගැටළුවකට මා මුහුණ දුන් අ අවස්ථාවේදී ඒ පිළිබඳව සම්පූර්ණ වගකීම භාර කරට ගනිමින්, සති තුනකටත් වඩා අඩු කාලයක් තුළදී, මා අපේක්ෂා කළ දිනටම, යම් යම් අඩුපාඩු සහිතව වුවද, තම රාජකාරී කටයුතුද කරන අතරතුරදී, හැකිතරම් නිවැරදි අයුරින් මෙය යතුරු ලියනය කරදුන්, නු/ හඟුරන්කෙත පරිභද මූලස්ථ මහා විද්‍යාලයේ ආචාර්ය, **ඩබ්ලිව්.එම්. අබේසිංහ බණ්ඩාර** මහතාණන්ටත්, එයට නොමඳව සහාය දුන්, නු/ බෝගම්මුව විද්‍යාලයේ ආචාරිනී **ජීවර්ණා අබේසිංහ** මහත්මියටත්, අවශේෂ වශයෙන් උදව් උපකාර කළ ආචාර්ය මහාචාර්ය තුමන්ලා ඇතුළු නී නොකී සියළු දෙනාටත් මාගේ හෘදයංගම භක්ති ප්‍රණාමය මෙයින් පිරිනමමි.